20....., .................. මස .......... දින

කොළඹ දී ය.

**නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී,**

අංක. 40, නවම් මාවත,

කොළඹ 02.

මහත්මයාණනි,

**බැංකු ඇපකර සම්බන්ධයෙන් වූ හානිපූරණ ලිපිය.**

(මෙහි මින්මතු "සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) ස්වකීය ලියාපදිංචි කාර්යාලය ........................................ දරන ස්ථානයේ පිහිටා ඇත්තා වූ ද ශ්‍රී ලංකාවේ අංක ............. දරන ලියාපදිංචි අංකය යටතේ 2007 අංක. 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් වන .................................................... සමාගම වන අප විසින් අපගේ සමාගමේ ඉල්ලීම පරිදි බැංකුව විසින් වෙනත් යම් පාර්ශවයක් වෙත දැනටමත් නිකුත් කර ඇති සහ දැනට අවසන් නොවී පවතින ඇපකර ලිපි සහ/හෝ ඇප බැඳුමකරවලට ("ඇපකර ලිපිවලට") අතිරේකව හෝ ආදේශක වශයෙන්, ඉහතකී අපගේ සමාගම විසින් වෙනත් යම් පාර්ශවයක් සමග ඇතුලත්වී ඇති ගිවිසුම් සම්බන්ධයෙන් යම් පාර්ශවයක් වෙත සමාගම විසින් ගෙවනු ලබන මුදල් සහතික කිරීම මගින් හෝ එසේ එම මුදල් සහතික කිරීම වෙනුවෙන් අවශ්‍ය විය හැකි තවදුරටත් වූ ඇපකර ලිපි නිකුත් කරන ලෙස (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) අංක. 40, නවම් මාවත, කොළඹ 02 යන ස්ථානයේ ස්වකීය ලියාපදංචි කාර්යාලය පිහිටා ඇත්තා වූ ද ලියාපදිංචි අංක. PQ 27 යටතේ 2007 අංක. 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති බැංකු සමාගමක් වන **නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී** ආයතනයෙන් සහ ඔබගේ හිමිකම්ලාභී අනුප්‍රාප්තිකයන්ගෙන් සහ පැවරුම්ලාභීන්ගෙන් මෙන්ම ඔබ හෝ ඔවුන් හරහා හෝ යටතේ හිමිකම්පාන සියලු තැනැත්තන්ගෙන් මෙයින් ඉල්ලාසිටිනු ලැබ ඒ සඳහා බලය පවරා සිටිනු ලැබේ.

(ඇපකර ලිපි සම්බන්ධයෙන් හෝ මෙම හාණිපූරණය යටතේ වූ ඔබගේ අයිතිවාසිකම් බලාත්මක කිරීමේ දී හෝ බලාත්මක කිරීම සඳහා උත්සාහ දැරීම සම්බන්ධයෙන් ඔබ විසින් දරනු ලැබිය හැකි සියලු නෛතික සහ වෙනත් පිරිවැය, ගාස්තු සහ වියදම් ඇතුලු) ඇපකර ලිපි සම්බන්ධයෙන් හෝ ඒ තුලින් උපචිතවන හෝ ඔබ විසින් එම ඇපකර ලිපි නිකුත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස උපචිතවන සියලු නඩුකටයුතු, ඉල්ලීම්, හිමිකම්පෑම්, වගකීම්, පාඩු, අලාභ, පොළිය, පිරිවැය, ගාස්තු, වියදම් හෝ වෙනත් ඕනෑම ආකාරයක මුදල්වලට එරෙහිව සහ ඒ

සම්බන්ධයෙන් බැංකුව හානිපූරණයකර නිදහස්ව තබන බවට අප විසින් එකඟව ප්‍රතිඥා දී සිටිනු ලැබේ.

එම මුදල් පළමුව ගෙවන ලද හෝ දරන ලද දින සිට අප විසින් එම මුදල් සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් (තීන්දුවට පසුව මෙන්ම පෙරද) ඒ මතවූ පොළියද සමග පළමුව ඉල්ලා සිටි අවස්ථාවේ දී අප විසින් එම මුදල් ඔබ වෙත ගෙවන බවට සහ ප්‍රතිපූරණය කරන බවට අප විසින් තවදුරටත් එකඟව සිටින අතර ඕනෑම ආකාරයකට හෝ ඕනෑම කාර්යයක් සඳහා බැංකුවේ සන්තකයට හෝ පාලනයට යොමුවන සියලු මුදල් සහ දේපළ මෙම හානිපූරණය සම්බන්ධයෙන් අප විසින් ලබාදෙන ඇපකරයක් වශයෙන් හිලව් කිරීමේ සහ බැංකුවට උචිත පරිදි යොදාගැනීමේ අයිතිය ඇතිව ඔඩපනය කරනු ලැබිය යුතු බවට අප විසින් එකඟව සිටනු ලැබේ.

අපගෙන් විමසීමකින් හෝ අපගෙන් තවදුරටත් බලය ලබාගැනීමෙන් තොරව සහ ඒ සම්බන්ධයෙන් සාධාරණීකරණය කිරීම විමසා බැලීමකින් තොරව හෝ ඇපකර ලිපි සම්බන්ධයෙන් හෝ ඒ යටතේ ඔබ වෙත ලැබී ඇති යම් ප්‍රකාශයක හෝ සහතික පත්‍රයක වලංගුභාවය, අව්‍යාජභාවය හෝ නිවැරදිභාවය පිළිබඳ සාධාරණීකරණය කිරීම විමසා බැලීමෙන් තොරව සහ අපගේ පාර්ශවයෙන් සිදුවන විරෝධයපෑම් නොසලකා හරිමින් ගිණුමෙන්/ගිණුම්වලින් මුදල් හරකිරීම සඳහා සහ ඇපකර ලිපි යටතේ හිමිකම්පාන ලෙස හෝ ඉල්ලා සිටින ලෙස පෙනීයන හෝ අදහස් කරනු ලබන යම් ගෙවීම් සිදුකිරීමට හෝ යම් ඉල්ලීම්වලට අනුකූලව ක්‍රියා කිරීම සඳහා අප විසින් ඔබවෙත අහෝසිකල නොහැකි ලෙස බලය පවරා සිටින අතර එවැනි හිමිකම්පෑම් හෝ ඉල්ලීම් මගින් අප බැඳීසිටින බවටත් අප සහ ඔබ අතර බැඳීම් සහගතවන බවටත් ඔබ විසින් ගෙවීම් කිරීම සඳහා හෝ ඒ සමග අනුකූලව ක්‍රියාකිරීමට බැඳීසිටින බවට එම හිමිකම්පෑම හෝ ඉල්ලීම තීරණාත්මක සාක්ෂියක් ලෙස අප විසින් පිළිගෙන සිටින බවටත් අප විසින් එකඟව සිටිනු ලැබේ.

එම මුදල සහ මුදල් කලින්කල වෙනස්වීම හෝ අඩුවීම හෝ උච්චාවචනය වීම හෝ සම්පූර්ණයෙන් ගෙවා නිමකිරීම පිළිබඳව නොසලකා හරිමින් සහ බැංකුව වෙත පවතින අපගේ ණයගැතිභාවය අවසන්වීමෙන් පසුව අලුත් වගකීම් දැරීම පිළිබඳව නොසලකා හරිමින් අප විසින් බැංකුව වෙත මෙහි මින්මතු යම් අවස්ථාවක දී සහ කලින්කල මෙන්ම සියලු අවස්ථාවලදී ගෙවිය යුතු හෝ ගෙවිය යුතුවන හෝ අයවිය හැකි හෝ අයවිය යුතු හෝ ගෙවීමට නියමිත වියහැකි හෝ ගෙවීමට නියමිතවන සියලූ සහ සෑම මුදලක් සහ මුදල් සම්බන්ධයෙන් මෙම හානිපූරණය අප කෙරෙහි සහ අපගෙන් එකිනෙකා කෙරෙහිවූ අඛණ්ඩ ඇපකරයක් වශයෙන් බැඳීම් සහගත විය යුතු ය.

මෙම හානිපූරණය යටතේවූ ඔබගේ අයිතිවාසිකම්, අපගෙන් හෝ වෙනත් යම් තැනැත්තකුගෙන් ඔබ විසින් දැන් හෝ පසුව දරනු ලැබිය හැකි වෙනත් එක් හෝ වැඩි හානිපූරණ, ඇපකර, හිලව්කිරීම් හෝ වෙනත් යම් බැඳීම්වලට අතිරේකව වියයුතු මෙන්ම කිසිදු එවැනි හානිපූරණ, ඇපකර හෝ හිලව්කිරීම්වලින් අගතිවිරහිත හෝ බලපෑමට ලක්වීමෙන් තොරව පැවතිය යුතු බවට අප විසින් තවදුරටත් එකඟව සිටිනු ලැබේ. ඔබ විසින් ඕනෑම අවස්ථාවක දී මාගෙන් හෝ අපගෙන් විමසීමකින් තොරව ගෙවීම්කිරීම සඳහා කාලයක් ලබාදීම හෝ වෙනත්යම් ඉඩදීමක් ප්‍රදානය කිරීම මෙන්ම ඕනෑම අවස්ථාවක දී ඔබ විසින් දරනු ලබන වෙනත්යම් හානිපූරණ, ඇපකර, හිලව්කිරීම් හෝ වෙනත්යම් බැඳීම් අත්හැරීම, ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම, වෙනස් කිරීම, හුවමාරු කිරීම හෝ සම්පූර්ණ කිරීමෙන් හෝ බලාත්මක කිරීමෙන් වැළකී සිටීම කරනු ලැබිය හැකිය; තව ද එහි යම් පාර්ශවයක් හෝ ඒවායින් යම් තැනැත්තකු මුදාහැරීම සහ නිශ්කාශනය කිරීම හෝ මෙම හානිපූරණය යටතේ වූ මාගේ/ අපගේ වගකීමවලට බලපෑමක් සිදුවීමෙන් තොරව ඔබ විසින් යෝග්‍ය බවට සලකන ආකාරයට ඇපකර ලිපියේ සඳහන් අර්ථලාභියා වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් සමග ඒකාබද්ධ කිරීම, ඒකාබද්ධ කිරීම් ප්‍රතිග්‍රහනය කිරීම සහ වෙනත් යම් වැඩපිළිවෙල සකස් කිරීම කරනු ලැබිය හැකිය.

මෙම ඇපකර ලිපියේ මුල් නියම ප්‍රකාරව හෝ අපගේ ඉල්ලීම පරිදි සහ ඒ සඳහා ඔබ විසින් එකඟවන ආකාරයට සහ ඇපකර ලිපිවල සඳහන් අර්ථලාභියා විසින් ඒ සඳහා එකඟවන ආකාරයට ඇපකර ලිපි කලින්කල වෙනස් කිරීම, සංශෝධනය කිරීම, අලුත් කිරීම හෝ දීර්ඝ කිරීම කරනු ලැබිය හැකි ය. එසේ කලින්කල වෙනස් කරනු ලබන, සංශෝධනය කරනු ලබන, අලුත් කරනු ලබන හෝ දීර්ඝ කරනු ලබන ඇපකර ලිපි සඳහා මෙම හානිපූරණය යටතේ වූ අපගේ වගකීම අඛණ්ඩව අදාල විය යුතු බවට ද අප විසින් පිළිගෙන සිටිනු ලැබේ.

එම ඉල්ලීම් හෝ හිමිකමපෑම් වලංගුවේද යන්න පිළිබඳව විමසා දැනගැනීමෙන් හෝ එසේ විමසා දැනගැනීම සඳහා වූ වගකීමෙන් තොරව සහ එම ඉල්ලීම් හෝ හිමිකම්පෑම් සපුරාලීම සම්බන්ධයෙන් අප විසින් බැංකුව වෙත යම් විරෝධයක් ගොනුකර තිබීම පිළිබඳ නොසලකා හරිමින් බැංකුව විසින් දැනටමත් නිකුත්කර ඇති සහ අවසන් නොවී පවතින සහ දැනට ඉදිරිපත්කර ඇති සහ මින්මතු නිකුත්කරනු ලබන මෙන්ම අවසන් නොවී පවතින සහ දැන් මෙන්ම මින්මතු නිකුත් කරනු ලබන ඇපකර ලිපි යටතේ වූ හෝ එම ඇපකර ලිපි යටතේ බවට සලකනු ලබන හෝ ඒවායින් එකක් යටතේ සහ ඒවා එකිනෙක යටතේ වූ බවට සලකනු ලබන කලින්කල සිදුකරනු ලබ නසියලු ඉල්ලීම් සහ හිමිකම්පෑම් සඳහා කිසිදු සැකකිරීමකින් තොරව ගෙවීම් කිරීමට බැංකුවට හිමිකමක් තිබිය යුතු ය.

එම සමාගමේ හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සීමාකිරීමක්, අවහිරකිරීමක්, නොහැකියාවක්, හැකියාව නොමැතිවීමක් හෝ බලය පැවරීමක් හේතුවෙන් බැංකුව විසින් නිකුත් කරන ලද ඉහතකී ඇපකර ලිපි මත එම සමාගම විසින් බැංකුව වෙත ගෙවීමට නියමිත වන මුදල හෝ මුදල්, පොළිය, කොමිස් මුදල් සහ වෙනත් ගාස්තු එම සමාගමෙන් අයකරගනු ලැබුවද, එසේ අයකරගනු නොලැබුවද, නැතහොත් බැංකුව වෙත එකී සමාගම විසින් ගෙවිය යුතු ඉහතකී මුදල් හෝ මුදල්, පොළිය, කොමස් මුදල් සහ වෙනත් ගාස්තු ගෙවීම් සඳහා වූ ඉහතකී සමාගමේ වගකීම බලාත්මක කිරීමට නොහැකිවීම හෝ වෙනත් ඕනෑම ආකාරයක හේතු හෝ අවස්ථානුගත කරුණු සහ බැංකුව විසින් දැනසිටින හෝ එසේ දැන නොසිටින වෙනත් කරුණු හෝ අවස්ථානුගත කරුණු පිළිබඳ නොලසකා හරිමින් මෙම හානිපූරණය වලංගු සහ බලාත්මක වියයුතු බවට අප විසින් මෙයින් තවදුරටත් එකඟව සිටිනු ලැබේ.

මෙම හානිපූරණය (මෙහි මින්මතු "මුල් අත්සන්කරුවන්" යනුවෙන් හඳුන්වනු ලබන) එක් තැනැත්තකුට වඩා වැඩි දෙනකු වෙනුවෙන් අත්සන්කර ඇත්නම්, සහ ඔවුන්ගෙන් එක් අයකු හෝ වැඩිදෙනකු (මෙම හානිපූරණය අනිසි ලෙස ලියා අත්සන් කිරීම අනුව නියමිත ත්ත්තවයක් නොමැතිවීම/ වෙනත් ඕනෑම ආකාරයක හේතුවක් නිසා) මෙම හානිපූරණයේ සඳහන් විධිවිධාන මගින් බැඳී නොසිටින අවස්ථාවකදී, එම මුල් අත්සන්කරු/ අත්සන්කරුවන් කිසිදු අවස්ථාවකදී මෙහි පාර්ශවයක්ව නොසිටි ලෙස සලකමින් ඉතිරි මුල් අත්සන්කරු/ අත්සන්කරුවන් මෙම හානිපූරණයේ විධිවිධාන මගින් අඛණ්ඩව බැඳී සිටිය යුතු වේ.

මෙම හානිපූරණය සඳහා එක් තැනැත්තකුට වඩා වැඩි දෙනකු විසින් අත්සන්කර ඇති අවස්ථාවක දී, එම පාර්ශව නිදහස් කිරීම හෝ මුදාහැරීම හේතුවෙන් මෙම හානිපූරණයේ අනෙක් පාර්ශවය වෙත කිසිදු අනිසි ප්‍රතිවිපාකයක් ඇතිවීමෙන් හෝ එම පාර්ශවයන්ට එරෙහිව ඔබගේ අයිතිවාසිකම් හෝ ප්‍රතිකර්ම සඳහා අන්‍යාකාරයකින් අගතියක් හෝ බලෑමක් ඇතිවීමෙන් තොරව මෙම හානිපූරණය සඳහා අත්සන්කර ඇති එක් තැනැත්තකු හෝ වැඩිදෙනෙකු වගකීමෙන් නිදහස් කිරීම හෝ මුදා හැරීම සඳහා හෝ ඒකාබද්ධ කිරීම සඳහා හෝ එම තැනැත්තන් සමග වෙනත් වැඩපිළිවෙලකට ඇතුළත් වීම සඳහා ඔබට නිදහස් ඇත්තේ ය.

මෙම හානිපූරණය සම්බන්ධයෙන් යම් අයිතිවාසිකමක්, බලතල, වරප්‍රසාදයක් හෝ ප්‍රතිකර්මයක් ක්‍රියාත්මක කිරීමේ දී ඔබගේ පාර්ශවයෙන් සිදුවන යම් ප්‍රමාදයක් හෝ මගහැරීමක් මගින් එම අයිතිය, බලතල, වරප්‍රසාදය හෝ ප්‍රතිකර්මය දුබලවීමක් නොවිය යුතු මෙන්ම එම අයිතිය, බලතල, වරප්‍රසාදය හෝ ප්‍රතිකර්මය අත්හැරීමක් ලෙෂ ෂලකනු නොලැබිය යුතු මෙන්ම එම අයිතියෙහි, බලතලවල, වරප්‍රසාදයේ හෝ ප්‍රතිකර්මයේ තනි හෝ අර්ධ ක්‍රියාත්මක කිරීමක් මගින් එම අයිතිය, බලතල, වරප්‍රසාදය හෝ ප්‍රතිකර්මය තවදුරටත් ක්‍රියාත්මක කිරීම

වලක්වාලනු ලැබීමක් හෝ වෙනත් යම් අයිතියක්, බලතල, වරප්‍රසාද හෝ ප්‍රතිකර්ම ක්‍රියාත්මක කිරීම වලක්වාලනු ලැබීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය. මෙම හානිපූරණයේ විධිවිධාන සලස්වා ඇති අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද සහ ප්‍රතිකර්ම ක්‍රමික එකතුවක් වන අතර ඒවා නීතිය මගින් විධිවිධාන සලස්වා ඇති යම් අයිතිවාසිකම්, බලතල, ප්‍රතිලාභ සහ ප්‍රතිකර්මවලින් සුවිශේෂී වූ ඒවා නොවන්නේ ය.

බැංකුව විසින් අපගේ ඉහතකී ඉල්ලීමට අනුකූලව ක්‍රියාකිරීමේ ප්‍රතිවාපිකායක් වශයෙන් බැංකුව විසින් ගනුලබන යම් ක්‍රියාමාර්ගයක් සම්බන්ධයෙන් බැංකුවට එරෙහිව අප විසින් අධකරණ නඩුකටයුතු හෝ තහනම් නියෝග ඉල්ලා නොසිටින බවට අප වසින් මෙයින් වගකීම් භාරගෙන බැංකුව සමග එකඟව සිටනු ලැබේ.

මේ යටතේ අපගේ වූ සියලු වගකීම් සපුරාලනු ලබන තෙක් මෙම හානිපූරණය බලාත්මකව පවතින බවට අප විසින් එකඟව සිටින අතර මේ යටතේ වූ ස්වකීය යම් හෝ සියලු අයිතිවාසිකම බැංකුව විසින් ඒ සඳහා අපගේ පූර්ව අනුමතය ලබාගැනීමෙන් තොරව වෙනත් යම් පාර්ශවයක් වෙත පැවරීමේ අයිතිය බැංකුව සතුවන බවට අප විසින් මෙයින් පිළිගෙන සිටනු ලැබේ.

මෙම හානිපූරණය ශ්‍රී ලංකාවේ නීති මගින් පාලනය වන බවට අප වසින් එකඟව සිටිනු ලැබේ.

මෙයට විශ්වාසී

වර්ෂ 20..... වූ .................. මස .......... දින දී ය.